**කොළඹ විශ්වවිද්‍යාලය - 2018**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

කොළඹ විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරන ප්‍රතිපත්ති වලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

-

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-------------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාලව මූල්‍ය හා කළමනාකරණ පීඨයේ කලින් ගෙවීම් රු.487,670 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.431,051 ක් ලෙස දක්වා තිබීමෙන් රු.56,619 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | කලින් ගෙවීම් ගිණුමේ ශේෂය රු.56,619.00 ක් අඩුවෙන් ගිණුම් ගත කර ඇත. | නිවැරදි ගිණුම් හඳුනාගෙන ගිණුම් තැබීම සිදුකළ යුතුය. |
| (ආ) | වෛද්‍ය පීඨයේ ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් විශ්වවිද්‍යාලයේ අරමුදලින් වැය කරන ලද රු.955,718,850 ක් භාණ්ඩාගාරයෙන් ලබාදෙන බවට එකඟතාවයක් නොමැතිව විවිධ ණයගැතියන් යටතේ භාණ්ඩාගාරය වෙතින් ලැබිය යුතු ලෙස දක්වා තිබුණි. | 2019 වර්ෂයේ අප්‍රේල් වන විටදී රු.75,437,445 ක් මුදල විශ්ව විද්‍යාලය වෙත ලැබී ඇත. ඒ අනුව ඉතිරි මුදල වූ රු.879,999,997.00 මුදල භාණ්ඩාගාරයෙන් මහල් 17 න් යුත් ගොඩනැගිල්ල සඳහා ලැබිය යුතු මුදලකි. මෙම මුදල් සම්බන්ධයෙන් 2018 | නිවැරදිව ගිණුම් තැබීම හා හෙළිදරව් කිරීම සිදුකළ යුතුය. |

| | | |
|---|---|---|
| | වර්ෂයේ මැයි මස සිට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හා අය-වැය දෙපාර්තමේන්තුව අතර සාකච්ඡා පවත්වෙන අතර 2019 වර්ෂයේදී ණය මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ලබා දීම සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලැබී ඇත. 2019.03.14 ගිණුම් ඉදිරිපත් කරන දිනය වන විට තිබූ තත්වය මත මේ ආකාරයෙන් ගිණුම් තැබීම සිදු කර ඇත. | |
| (ඈ) විශ්වවිද්‍යාලයේ පීඨ සහ වෙනත් අංශ වෙනුවෙන් වැය කරන ලද රු.139,240,643 ක් ලැබිය යුතු ලෙස ණයගැතියන් යටතේ දක්වා තිබුණි. | මෙම මුදල, පර්යේෂණ කළමණාකරන ඒකකය වෙත ලැබීම් රු.1,053,332 වෛද්‍ය පීඨය වෙත ලැබීම් රු.1,132,417 පර්යේෂණ කළමණාකරන ඒකකයෙන් ලැබීම් රු. 124,710 උපාධි අධ්‍යයන පීඨයෙන් ලැබීම් රු.55.577 උපාධි අධ්‍යයන පීඨ ගොඩනැගිල්ල සඳහා ලැබිය යුතු රු.136,808,614 NEREC න් ලැබිය යුතු රු.65,993 රු.1,053,332, රු.124,710 , රු.55,577 හා රු.65,993 ක් වූ මුදල් මේ වන විට ඒ ඒ අංශ වෙතින් ලැබී ඇත. | නිවැරදිව ගිණුම් තැබීම සිදුකළ යුතුය. විශ්වවිද්‍යාලයේ එක් එක් අධ්‍යයන අංශවලින් ලැබිය යුතු ශේෂ අභ්‍යන්තර ගනුදෙනු බැවින් මූල්‍ය ප්‍රකාශනවල එලෙස දැක්වීම නිවැරදි නොවේ. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ වත්කම් ඉවත් කිරීමේ අලාභය රු.621,955 ක් වුවද එය රු.4,175,980 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමෙන් වර්ෂයේ ලාභය රු.3,554,025 කින් අඩු වී තිබුණි. | 2019 වර්ෂයේදි නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | නිවැරදිව ගිණුම් තැබීම සිදුකළ යුතුය. |

**1.5.3 නොසැසඳුණු පාලන ගිණුම් හා වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| ආයෝජන | 1,783,693,156 | 1,783,293,156 | 400,000 | 2005 වර්ෂයේදී විද්‍යාල මන්දිරයෙහි තිබූ ගිණුම් වෛද්‍ය පීඨය වෙත මාරු කිරීමේදී විද්‍යාල මන්දිරයේ ලෙජර් ගිණුමෙහි වූ වරදකින් පැන නැගී ඇත. 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | නිවැරදිව ගිණුම් තැබීම සිදුකළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 අත්තිකාරම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) විශ්වවිද්‍යාලය විසින් 2016 සහ 2017 වර්ෂවල ලබාදුන් රු.152,672 ක් වටිනා පුස්තකාල අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවා නොතිබුණි. | සගරා තොග අවසන් වීම මත සහ ප්‍රකාශයට පත්කර නොතිබීම මත විශ්වවිද්‍යාලය වෙත ලැබී නොතිබීමෙන් අත්තිකාරම් පියවීම ප්‍රමාද වී ඇත. සියලුම සඟරා ලැබුණු පසු අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කරනු ලැබේ. | අදාළ කාර්යය නිම වූ වහාම ලබාගත් අත්තිකාරම් පිය විය යුතුය. |
| (ආ)අත්තිකාරම් ලබාදීමේදී නිසි පුරෝකථනයන් මත අත්තිකාරම් මුදල් ලබාදිය යුතු වුවත් අවස්ථා 52කදී රු.1,144,606 ක වියදමක් දැරීම සඳහා රු.2,877,187 ක් අත්තිකාරම් ලබා දී තිබුණි . ඉතිරියේ පරාසය රු.1,800 සිට රු.86,365 දක්වා පැවතුණි. | අත්තිකාරම් පිළිබඳ නීතිරීති නිසි පරිදි ක්‍රියාත්මක කරන ලෙස නිලධාරීන්ට උපදෙස් දී ඇත. | මූල්‍ය කළමනාකරණය විධිමත්ව පවත්වා ගත යුතුය. |

### 1.6.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 හා 2015 ජුලි 14 දිනැති අංක 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ලබාගත් අත්තිකාරම් අදාළ කාර්යය නිමකොට කඩිනමින් පියවිය යුතු වුවත් අවස්ථා 48 කදී ලබා දී තිබු එකතු වටිනාකම රු.3,801,491 ක අත්තිකාරම් පියවීම සඳහා දින 60 සිට දින 291ක් දක්වා ප්‍රමාද වී තිබූ අතර අවස්ථා 17 කදී එකතු වටිනාකම | අත්තිකාරම් පිළිබඳ නීතිරීති නිසි පරිදි ක්‍රියාත්මක කරන ලෙස නිලධාරීන්ට උපදෙස් දී ඇත. | නීතිරීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | රු.5,528,964 ක විවිධ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පියවා නොතිබුණි. | | |
| (ආ) | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය<br>(i) X පරිච්ඡේදය 1.9 වගන්තිය | විගණනයේදී සිදුකරන ලද නියැදි පරීක්ෂාවේ දී විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා නිවාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. | මෙය ක්‍රියාත්මක කිරීම සඳහා 88 විගණන කමිටුවේදී සාකච්ඡා කරන ලදී .එහිදී එය පීඨාධිපති කමිටුව හරහා දැනුවත් කර විශ්ව විද්‍යාලයේ සියලුම පීඨ සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජනා විය. | නීතිරීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු සිදුකල යුතුය. |
| | (ii) XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරීන් පැමිණීම හා පිටවීමේ වේලාවන් සටහන් කළ යුතු වුවත් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 618 දෙනෙකුගේ පැමිණීම හා නිවාඩු සනාථ කරගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ රු.677,219,763 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ රාජකාරී කටයුතු පැය 08ට සීමා කළ නොහැකිය එසේම අදාල ආචාර්යවරුන් විසින් පවත්වන දේශන සඳහා සහභාගි වන සිසුන්ගේ අත්සන් ලබා ගැනීමට සිදුවන අතර එය අදාළ ආචාර්යවරයා දේශන වලට පැමිණි බව සනාථ කරන්නකි.<br>එසේම සනාතන සභාව විසින් සම්මත කර ඇති නියාමයන් අනුව ආචාර්යවරුන් කටයුතු කරනු ලැබේ. | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට අනුකූලව සහ රජය විසින් පනවනු ලබන නීති, රීතිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2015 සැප්තැම්බර් 18 දිනැති අංක 13/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | නිලවාහන හිමි තනතුරු දරන නිලධාරීන්ට අනුයුක්ත නිල වාහන සඳහා හිමි ඉන්ධන දීමනාව මාසික වැටුපට එකතුකොට ගෙවීම් කළ යුතු වුවත් ඊට පටහැනිව නිලධාරීන් 10 දෙනෙකු සඳහා විශ්වවිද්‍යාලයේ ඉන්ධන ඇණවුම් මගින් ඉන්ධන ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ඉන්ධන ඇනවුම් මගින් නිලධාරීන්ට හිමි මාසික ඉන්ධන දීමනාව ඉක්මවා රු.1,905,898 ක ඉන්ධන ලබා දී තිබුණි. | මේ සඳහා පාලක සභාවෙන් ලද අනුමැතිය අනුව ක්‍රියාකර ඇත. | නීතිරීති හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු සිදුකල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.283,376,912 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.100,379,281 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.182,997,631 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන රු.739,168,000 කින් සහ පුද්ගල පඩිනඩි හා පුනරුත්ථාපන වියදම් පිළිවෙලින් රු.507,820,748 කින් හා රු.33,344,325 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයට අදාල භාණ්ඩ ඇනවුම් 28 කට අදාලව රු.16,434,490 ක් වටිනා භාණ්ඩ සැපයීම මාස 02 සිට මාස 11දක්වා ප්‍රමාද වීම හේතුවෙන් ආයතනයේ සාමාන්‍ය කටයුතුවලට බාධා ඇති වී තිබුණි. | භාණ්ඩ ලැබීම් ප්‍රමාදයන් ඇත. සැපයුම්කරුවන් සමඟ එළඹෙන ගිවිසුම් සංශෝධනය කර 2019 ජනවාරි සිට සියළුම ප්‍රමාද ගාස්තු සැපයුම්කරුවන්ගෙන් දඩ මුදල් අය කර ගැනීමට කටයුතු කර ඇත. | සැපයුම් ගිවිසුම්වලට එළඹීමේදී ගිවිසුම් කොන්දේසි කෙරෙහි වඩා සැලකිලිමත් විය යුතුය. |
| (ආ) | විද්‍යා පීඨයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකු තම රෝගී තත්ත්වය හේතුවෙන් වරින් වර වෛද්‍ය නිවාඩු, විවේක නිවාඩු, සප්ත වාර්ෂික නිවාඩු ලබාගෙන තිබූ අතර 2018 වර්ෂයේ අධ්‍යයන කාලසටහන තුළ මෙම මහාචාර්යවරයා වෙනුවෙන් දේශන පැය වෙන් කර නොතිබියදී මාස 09ක කාලයක් සඳහා රු.3,397,055 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. එසේම එම පීඨයේම ආචාර්යවරයෙකු විශ්‍රාම ගිය දිනයෙන් පසු දේශන සහභාගීත්වයකින් තොරව වැටුප් හා දීමනා ලෙස මාස 5ක් සඳහා රු.1,012,674 ක් ගෙවා තිබුණි. | • එම මහාචාර්ය වරයා විසින් ඔහුගේ සප්ත වාර්ෂික නිවාඩු කාල සීමාව සඳහා 01-11-2015) සිට 31-10-2017දක්වා ( අදාල පර්යේෂණ ක්‍රියාකාරකම් සම්බන්ධ විද්‍යා පීඨයේ අනුමැතිය සහිත වාර්තාව 19-03-2019 දිනැති ලිපිය මගින් එවා ඇත .තවද, මෙම ආචාර්යවරයා 21.02.2019 දිනැති ලිපිය මඟින් 21.05.2019 දින සිට සේවයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එම ඉල්ලීම විශ්ව විද්‍යාලයේ 10.04.2019 වන දින පැවති 551 වන පාලක සභාව විසින් අනුමත කර ඇත. | ආචාර්යවරුන්ගේ කාර්යයන් ඉටුකිරීම සනාථ කරගැනීම සඳහා කළමණාකාරීත්වය සුදුසු වැඩපිළිවෙලක් හා ඒ සඳහා සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | • මෙම ආචාර්යවරයාගේ සේවා කාලය විද්‍යා පීඨයේ එම අධ්‍යයන වර්ෂය අවසාන දවස වන 2018.01.14 දක්වා දීර්ඝ කරන ලද අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සේවා කාලය 2018.09.30 දින දක්වා දීර්ඝ කරන ලද බව විද්‍යා පීඨයට දන්වා තිබුණි. | |
| (ඇ) | විද්‍යා පීඨයේ හා කළමනාකරණ පීඨයේ සමාලෝචිත වර්ෂයේ ඇතුළත් කරගත හැකි ශිෂ්‍ය ධාරිතාවය පිළිවෙලින් 515 ක් හා 520 ක් වුවත් බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 501 ක් හා 515 ක් වූයෙන් ශිෂ්‍යයින් 19 දෙනෙකු සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වී තිබුණි. | කළමනාකරණ පීඨය සඳහා සිසුන් 520 කට ශිෂ්‍ය ලියාපදිංචිය සඳහා ලිපි සහ විද්‍යුත් තැපැල් මාර්ගයෙන් දැනුම් දුන්නද ලියාපදිංචිය සඳහා පැමිණියේ සිසුන් 515 ක් පමණි. මේ පිළිබඳව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දන්වා ඇත. | ධාරිතාවය අනුව සියලුම ශිෂ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශාස්ත්‍ර පීඨයේ ශිෂ්‍ය ධාරිතාවය 550ක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දන්වා තිබුණ ද කොමිෂන් සභාව නිර්දේශ කළ සත්‍ය වශයෙන්ම බඳවා ගැනීම් 713ක් වූ අතර එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත වාර්තා කර තිබූ සංඛ්‍යාවට වඩා සියයට 29.6ක වැඩි වීමකි. | සාමාන්‍යයෙන් කලා පීඨය සඳහා සාමාන්‍ය ප්‍රවේශය සඳහා සිසුන් 550 ක් ලියාපදිංචි කර ගනී. ඊට අමතරව පහත හේතු නිසා සිසුන් ප්‍රමාණය 605 දන්වා වැඩි වී ඇත.<br>*.විශේෂ පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි කිරීම (New Admission for Special Subjects)<br>* අතිරේක ප්‍රවේශය සඳහා සිසුන් ලියාපදිංචි කිරීම (Additional Intake)<br>* විශේෂ අවශ්‍යතා ඇති සිසුන් ලියාපදිංචි කිරීම (Blind & Disabled Students) | බඳවාගැනීමට හැකි උපරිම සංඛ්‍යාව නිවැරදිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂමම වෙත දැන්විය යුතුය. |
| (ඉ) | කොළඹ විශ්වවිද්‍යාලයේ නේවාසික පහසුකම් ඉල්ලුම් කළ ශිෂ්‍ය සංඛ්‍යාව හා එම පහසුකම ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව හා සැසඳීමේදී පළමු වසරේ සිට සිව්වන වසර දක්වා ශිෂ්‍ය කණ්ඩායම් සඳහා නේවාසික පහසුකම් ලබා දීම පිළිවෙලින් සියයට 22, 40, 44ක් සහ 33ක් ලෙස අවම මට්ටමක පැවති අතර විශ්වවිද්‍යාලය සතු නේවාසිකාගාර 17ක තව දුරටත් සිසුන් 243 කට නේවාසික පහසුකම් සැපයීමට ඉඩපහසුකම් තිබුණි. එසේ තිබියදී බදුකුලී පදනම මත නේවාසිකාගාර 02 ක් ලබාගෙන රු.5,400,000 ක් බදුකුලී ලෙස | නේවාසිකාගාර වෙත ශිෂ්‍යයන් අනුයුක්ත කිරීමට නොහැකි වූයේ පහත සඳහන් කරුණු හේතුවෙනි.<br>*මුත්තයියා නේවාසිකාගාරයෙහි "බී" ගොඩනැගිල්ලේ වහලය හා සිවිලිම අබලන් වී ඇති බැවින් එහි අළුත්වැඩියා කටයුතු සිදුකරන තෙක් එම ගොඩනැගිල්ලේ සිටි 66දෙනාගෙන් ශිෂ්‍යාවන්ගෙන් 44 දෙනෙක් වෙනත් නේවාසිකාගාර වෙත (ද සේරම් නව, හැව්ලොක්, බුලර්ස්) අනුයුක්ත කිරීමට සිදු වුණි. | සිසුන්ගේ නේවාසිකාගාර අවශ්‍යතාවය කලින් නිශ්චය කිරීම හා පවතින නේවාසිකාගාර ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කල යුතුය. |

සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබූ අතර එහි නේවාසිකව සිටිය හැකි ශිෂ්‍ය සංඛ්‍යාව 108 ක් වුවද සත්‍ය වශයෙන් සිසුන් 55 ක් පමණක් නේවාසිකව සිටින බව නිරීක්ෂණය විය.

මීට අමතරව භික්ෂු නේවාසිකාගාරය 2006 වර්ෂයේ සිට බදුකුලී පදනම මත පෞද්ගලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යන අතර මාසික කුලිය රු.325,000 ක් බැගින් 2018 වර්ෂය සඳහා රු.3,900,000 ක් ගෙවා තිබූ අතර එහි භික්ෂූන් 50 කට නේවාසිකව සිටිය හැකි වුවත් ශිෂ්‍ය භික්ෂූන් 15 ක් පමණක් නේවාසිකව සිටින බව නිරීක්ෂණය විය.

**හැව්ලොක් නේවාසිකාගාරයේ පැරණි ගොඩනැගිල්ලෙහි කොටසක් කඩා ඉවත් කළ යුතුව තිබූ බැවින් එහි සිටි ශිෂ්‍යාවන් 148 දෙනෙකු 2018 අගෝස්තු මස සිට ඉවත් කර ඇත.

***එසේම හේවා මාවත නේවාසිකාගාරයෙහි නාන කාමර තුනක ජල කාන්දු පවතින බැවින් ශිෂ්‍යාවන් 10දෙනෙකු හට නේවාසිකාගාරයෙහි නේවාසික පහසුකම් ලබා දීමට නොහැකි වුණි.

රාජගිරිය හා බොරලැස්ගමුව නේවාසිකාගාරයන් කුලී පදනම මත ලබා ගෙන ඇත.

කොළඹ විශ්වවිද්‍යාලය කුලී පදනම මත ග්‍රීන්පාත් හි පිහිටි නිවස භික්ෂු නේවාසිකාගාරයක් ලෙස මෙතෙක් පවත්වා ගෙන යාමට සිදුව ඇත්තේ භික්ෂූන් වහන්සේලා වෙනත් නිවසකට යාම ප්‍රතික්ෂේප කරන බැවිනි. කොළඹ විශ්වවිද්‍යාලය සඳහා භික්ෂු නේවාසිකාගාරයක අවශ්‍යතාවය ඇති නමුත් එය ඉදි කිරීම ප්‍රමාද වී ඇත්තේ එම ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා සුදුසු ඉඩමක් මෙතෙක් සොයා ගැනීමට නොහැකිවීම නිසා වන අතර 2018.05.09 වන දින උපකුලපතිතුමන් විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත යවන ලද ලිපිය මඟින් කොළඹ විශ්වවිද්‍යාලය සඳහා භික්ෂු නේවාසිකාගාරයක අවශ්‍යතාවය දන්වා ඇතත් මෙතෙක් ඒ සම්බන්ධව ප්‍රතිචාර ලැබී නොමැත.

(ඊ) ආයතනය තුළ සමාගමක් ආරම්භ කිරීමට පෙර ප්‍රතිපත්තිමය තීරණයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන අමාත්‍යාවරයාගේ නිර්දේශ සහිතව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවත් එවැනි අනුමැතියකින් තොරව සමාගම් පනත යටතේ 2013වර්ෂයේ දී කළම්බු සයන්ස් ඇන්ඩ් ටෙක්නොලොජි සෙල් නමින්

මේ පිළිබඳව අවශ්‍ය කටයුතු කිරීම සඳහා 2017 ජුලි 04 වන දින ප.ව 2.30ට කාරක සභා කාමර අංක 05 හි පැවති 93 වන පොදු ව්‍යාපාර පිළිබඳ රැස්වීමේදී අමාත්‍යාංශ ලේකම්ට පවරන ලදී.

විශ්වවිද්‍යාලය තුල සමාගම් ආරම්භ කිරීමට පෙර අවශ්‍ය අනුමැතීන් හා විශ්වවිද්‍යාලයේ සම්පත් භාවිතා කිරීම් සම්බන්ධව පූර්ව එකඟතා ගිවිසුම්වලට එළඹිය යුතුය.

ඇපයෙන් සීමිත සමාගමක් ලියාපදිංචි කර තිබුණි. මෙම සමාගමේ ප්‍රධාන කාර්යාලය කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයට අයත් ගොඩනැගිල්ලක පිහිටුවා විශ්වවිද්‍යාලය සතු දේපළ භාවිතය පිළිබඳ එකඟතා ගිවිසුමකට ඇතුළත් වීමකින් තොරව පරිගණක උපාංග ඇතුලු අනෙකුත් භෞතික හා මානව සම්පත් භාවිතා කර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.479,684 ක මුදලක් පමණක් විශ්වවිද්‍යාලය වෙත ගෙවා තිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට ගිවිසුම් හා බැදුම්කර කඩ කල ආචාර්යවරුන් 25 දෙනෙකුගෙන් රු.52,650,521 ක මුදලක් අයවීමට තිබුණි. | ගිවිසුම් හා බැදුම්කර කඩකල ආචාර්යවරුන් ගෙන් අයවීමට ඇති මුදල් විවිධ ක්‍රම මගින් ලබා ගැනීම සඳහා කටයුතු කර ඇත. | බැදුම්කර මුදල් අයකර ගැනීම කාර්යක්ෂමව කල යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී මූලධන වියදම් වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් ලද රු.565,000,000 ක ප්‍රතිපාදනයෙන් රු.141,820,522 ක් පුනරාවර්තන වියදම් සඳහා වැය කර තිබුණි. | ප්‍රාග්ධන වියදම් සඳහා ලැබූ මුදලින් රු.141,821,082 ක් පුනරාවර්ථන වියදම් දරා ඇත. | ප්‍රාග්ධන ප්‍රතිපාදන වියදම් කළ හැකි වන්නේ ප්‍රාග්ධන ස්වරූපයේ කාර්යයන් සඳහා පමණක් වේ. |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදල් 123 කින් සමන්විත වූ “Designated Fund” නමින් වූ අරමුදලේ සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ගනුදෙනුවක් සිදු නොවූ අරමුදල් 33ක ට අදාළ රු.190,053,440ක මුදලක් ඌන උපයෝජිතව තිබුණි. | විශ්වවිද්‍යාල පනතේ 99 වගන්තිය යටතේ සියළුම අරමුදල් එකම අරමුදලක් යටතේ ගැනෙන අතර, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාලයීය පනතේ 45 (w) වගන්තිය යටතේ පාලක මණ්ඩලය වෙත ඕනෑම අරමුදලක් පවත්වාගෙන යාමට හා එහි අරමුදල් භාවිත කිරීම සඳහා බලය දී ඇත.<br>අරමුදල් පාලනයේ පහසුව සඳහා පවත්වාගෙන යනු ලබන ලෙජර් ගිණුම් වේ. මුළු අරමුදල් වල එකතුව රු.1,706,460,042 ක් වන අතර භාවිතා කර ඇති වටිනාකම රු. මිලියන 1139 කි.<br>මේ අනුව මුළු අරමුදලින් සියයට 66.76 ක් භාවිත කර තිබේ. එසේම ඉතිරි අරමුදල් ඒ ඒ දෙපාර්තමේන්තු වල ප්‍රාග්ධන අවශ්‍යතාවයන් පැමිණි විට උපයෝජනයට ගනු ලබයි. | අරමුදල පිහිට වූ අරමුණ සඳහා යොදාගත යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විද්‍යා පීඨයේ කේ.ජී ශාලාව ප්‍රතිසංස්කරණය සහ වහලය අළුත්වැඩියා කිරීම සඳහා ලංසු ආරාධනාව පුවත්පත් 03ක පළකර තිබූ අතර එක් එක් දැන්වීම් වල පැවති පරස්පරතාවය හේතුවෙන් නැවත සංශෝධිත දැන්වීමක් පළ කිරීමට සිදුවීම හේතුවෙන් ආයතනයට රු.229,185 ක පාඩුවක් සිදුවී තිබුණි. | සංශෝධිත පුවත්පත් දැන්වීමක් පළකිරීමට සිදු වී ඇත්තේ දැන්වීම්වල පැවති පරස්පරතාවය නිසා නොව එක් ලංසුකරුවෙකු විසින් CIDA ආයතනයට කරන ලද ලිඛිත දැනුම් දීමක් මත CIDA ආයතනය විසින් ලබා දුන් උපදෙස් අනුව ලංසු පත්‍ර නිකුත් කිරීමේ කාලය දීර්ඝ කිරීමට සිදු වීම නිසා ය. | ප්‍රසම්පාදන කටයුතු නිසි පරිදි සැලසුම් කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට මහාචාර්ය හා කථිකාචාර්ය අනුමත තනතුරු 723 ක් පැවති අතර තථ්‍ය සංඛ්‍යාව 586ක් වීමෙන් පුරප්පාඩු 137ක් විය. මේ තුළ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරු පුරප්පාඩු 27ක් පැවතුණි. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 183ක් පැවතුණි. | 2018 වර්ෂය තුළදී නව බඳවා ගැනීම් 62 ක් සිදුකල අතර වර්ෂය අවසාන වන විට ඊට සාපේක්ෂව ආචාර්යවරුන් 24 දෙනෙක් සේවයෙන් විශ්‍රාම ගැනීම,ස්ථාන මාරු වීම්, සේවයෙන් ඉල්ලා අස්වීම, සේවය හැර ගියා සේ සැලකීම, සේවය අවසන් වීම්, සේවයෙන් නිදහස් කිරීම් මඟින් කාර්ය මණ්ඩලයෙන් ඉවත්වීම නිසා සැලකිය යුතු පුරප්පාඩු සංඛ්‍යාවක් විශ්ව විද්‍යාලය තුළ ඇතිවීම වැළැක්විය නොහැකි බව වැඩි දුරටත් දන්වා සිටිමි. කෙසේ වුවද, මෙම පුරප්පාඩු පිරවීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදුකර ගෙන යමින් පවතියි. | පුරප්පාඩු කඩිනමින් පිරවිය යුතුය. |